**ජපන් තානාපති කාර්යාලය**

අංක 20, ග්‍රෙගරි පාර, කොළඹ 7
දුරකථක : +94-11-2693831~3, ෆැක්ස් : +94-11-2698629
ඊමේල් : cultujpn@co.mofa.go.jp

**පුවත්පත් නිවේදනය**

මාර්තු 7, 2013

# ජපන් රජයෙන් මන්නාරම දිස්ත්‍රික්කයේ ධීවර ව්‍යාපෘතියක් සඳහා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA) ට රුපියල් මිලියන 8.2 ක ආධාරයක්

ජපන් රජය විසින් බිම් මට්ටමේ මානව සුරැකීමේ ආධාර ව්‍යාපෘතිය (GGP) යටතේ මන්නාරම දිස්ත්‍රික්කයේ අවතැන්ව නැවත පදිංචි වූ ධීවර ප්‍රජාවගේ ආර්ථිකය නගා සිටුවීම සඳහා ඇමරිකානු ඩොලර් 65,735 (දළ වශයෙන් රුපියල් මිලියන 8.2) ක් පරිත්‍යාග කරන ලදි.

මෙම ආධාර තුලින් මඩ ටැංකි 10ක් සමග අවසාදිත ටැංකි ජල සැපයුම් සහ පිටකිරීමේ කාණු පද්ධති සේවා ගොඩනැගිල්ලක් සහිතව මූලික මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකකයක් ඉදිකරන අතර ඒ සඳහා අවශ්‍ය සියළුම උපකරණ මෙන්ම ජල ජීවී වගාව සහ මිරිදිය මත්ස්‍ය කර්මාන්තය පිළිබඳව පුහුණුවද ධීවර ප්‍රජාවට ලබාදීම සිදුවේ ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA) හරහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අතර ඒ තුලින් මන්නාරම දිස්ත්‍රික්කයේ සිරික්කුලම ගම්මානයේ නැවත පදිංචි වූ ප්‍රජාවගේ අහාර සුරක්ෂිතභාවය සහ ආදායම් වැඩිදියුණු කිරීමට බලාපොරොත්තු වේ.

මූලික මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකකයක් ඉදිකිරීමේ අරමුණ වනුයේ වසරකට මත්ස්‍ය බීජ මිලියන දෙකක් පමණ නිෂ්පාදනය කර මන්නාරමේ යෝධ වැවේ සහ වෙනත් කුඩා ජලාශ වල මත්ස්‍යයන් බෝකර මන්නාරම දිස්ත්‍රික්කයේ ධීවර සංගම් 108කට සෘජුව සහ ධීවරයන් 70,000 ට පමණ වක්‍රවත් මෙම ව්‍යාපෘතිය හරහා ප්‍රතිලාභ ලැබෙනු ඇත

ජපන් තානාපති නොබුහිතෝ හොබෝ මහතාත්,  ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ (NAQDA) අධ්‍යක්ෂක ජෙනරාල් නිමල් චන්ද්‍රරත්න මහතාත් , 2013 මාර්තු මස 7 වන දින තානාපති නිල නිවසේදී මෙම ආධාර ගිවිසුම අත්සන් කරන ලද අතර, ජනාධිපති උපදේශක මහාචාර්ය රජිව විජේසිංහ මහතාද එම අවස්ථාවට සහභාගි විය.

**වැඩි විස්තර සඳහා, කරුණාකර විමසන්න**

**ආර්ථික සහයෝගිතා අංශය, ජපන් තානාපති කාර්යාලයය**

දුරකථන 011-2693831 දිගු අංකය 225

ඊ මේල් : cultujpn@co.mofa.go.jp